ස.සේ.කොා චක්‍රලේඛ : 02/2026

මගේ අංකය : NWP/CEC/1/Cir/1
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ),
දෙවන මහල,
නව පළාත් සභා ගොඩනැගිල්ල,
කුරුණෑගල.
2026.09.07

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

මූලික විමර්ශන හා විනය පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීම

සමුපකාර සේවකයින් පිළිබඳ මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පවත්වනු ලබන නිලධාරීන්ට ගෙවීම් කිරීම පිළිබඳ විධිවිධාන ඇතුළත් ස.සේ.කොා.04/2019 හා 04/2020 චක්‍රලේඛ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙම චක්‍රලේඛය 2026.09.01 දින සිට ක්‍රියාත්මක වේ.

02. මූලික විමර්ශන

2:1 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට ඉදිරියට මූලික විමර්ශන පැවැත්වීම සඳහා පත් කරන නිලධාරීන්ට පහත පරිදි දීමනා ගෙවිය හැකිය. මෙම දීමනා ගෙවිය යුතු වන්නේ මූලික විමර්ශනය නිම කර වාර්තාව භාර දීමෙන් අනතුරුව පමණි.

ඉටු කරන කාර්යය	දීමනාව (රු.)
මූලික විමර්ශන වාර්තාව ඉදිරිපත් කිරීම	3000.00
චෝදනා පත්‍ර කෙටුම්පත් පිළියෙල කර ඉදිරිපත් කිරීම	1000.00

2.2 ඉහත 2.1 ඡේදයේ සඳහන් දීමනාවලට අමතරව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් තිබේ. විශ්‍රාමික පරීක්ෂණ නිලධාරියෙකුට ඔහු විශ්‍රාම යන විට රජයේ සේවයේ දැරූ තනතුර පදනම් කරගෙන ද රාජ්‍ය සේවයේ නියුතු පරීක්ෂණ නිලධාරියෙකුට ඔහු දරන තනතුර පදනම් කරගෙන ද සමුපකාර සමිතියක නිලධාරියෙකු නම් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් කළින් කළට නියම කරනු ලබන චක්‍රලේඛ විධිවිධාන අනුව නියම කරනු ලබන පරිදි ද ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත. පරීක්ෂණය අවසානයේ පරීක්ෂණ වාර්තාව භාරදීමෙන් පසුව ඉහත පරිදි ගෙවීම් කළ යුතුය.

2.3 ඉහත 2.1 ඡේදයෙහි සඳහන් දීමනා ලබා ගැනීමට නම් මූලික විමර්ශනයක් සඳහා සමිතිය විසින් නියම කර ඇති කාලසීමාව තුළ එකී පරීක්ෂණය අවසන් කර තිබිය යුතු අතර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට නිර්දේශ කරන්නේ නම් මූලික විමර්ශන වාර්තාව සමඟ චෝදනා පත්‍ර කෙටුම්පත ද සකස් කර භාර දීම නියමිත කාලසීමාව තුළ සිදු කර තිබිය යුතුය. මූලික විමර්ශනයක් හැකි තාක් ඉක්මනින් අවසන් කළ යුතු අතර ප්‍රායෝගික ගැටලු මතු වන අවස්ථාවලදී උපරිම වශයෙන් මාස 03ක්වත් ඇතුළත නිම කළ යුතුය.

CamScanner

2.4 මූලික විමර්ශන නිලධාරියෙකු වෙත හෝ කමිටුවක් වෙත 02 ඡේදයට අදාළ ගෙවීම් කිරීමට පෙර ඉදිරිපත් කර ඇති මූලික විමර්ශන වාර්තාවේ ගුණාත්මකභාවය පිළිබඳව ද අදාළ බලධරයන් විසින් අවධානය යොමු කර අවශ්‍ය වන්නේ නම් වාර්තා විධිමත් කරවා ගත යුතුය.

03. විනය පරීක්ෂණ

3.1 විනය පරීක්ෂණ පවත්වන නිලධාරීන්ට පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

	පරීක්ෂණය පැවැත්වෙන පැයකට දීමනාව	තැපැල් ගාස්තු වශයෙන් වැය වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම	අවසාන වාර්තාව පිළියෙල කිරීම
1.පරීක්ෂණ නිලධාරි	රු: 800.00	රු: 1000.00	රු: 10000.00
2.පැමිණිල්ල මෙහෙයවන නිලධාරි	රු: 600.00	-	රු: 3500.00

3.2 විනය පරීක්ෂණයට අදාළව කාර්යය සටහන් යතුරු ලියනය කිරීමට හෝ පරිගණක ගත කිරීමට හෝ පැයක කාලයක් සඳහා රු.250.00ක දීමනාවක් ගෙවිය හැකිය. සමුපකාර සමිතිය විසින් ලිපිකරු/යතුරු ලේඛක/පරිගණක සහාය හා තැපැල් ගාස්තු සපයනු ලබන්නේ නම් පරීක්ෂණ නිලධාරියාට ඒ සඳහා නියමිත මුදල ලැබීමට හිමිකමක් නැත.

3.3 විනය පරීක්ෂණ නිලධාරියෙකු/පැමිණිල්ල මෙහෙය වන නිලධාරියෙකු පරීක්ෂණය සඳහා නියම කර ගත් ස්ථානයට නියමිත දින නියමිත වෙලාවට පැමිණිය මුත් ඔහු වගකිව යුතු නැති විශේෂ කරුණක් පදනම් කරගෙන මෙම පරීක්ෂණය වෙනත් දිනකට කල් තබන්නේ නම් සැසි දිනක පැයකට ගෙවනු ලබන දීමනා මුදලින් අඩක් පැය 04ක කාලසීමාවකට යටත්ව ගෙවිය හැකිය.

3.4 යම්කිසි විශේෂ හේතුවක් පදනම් කරගෙන පරීක්ෂණයේ වාර්තාව ලබාදීමට මාස 06කට වඩා ප්‍රමාද වන්නේ නම් විනය පරීක්ෂණ නිලධාරියාට අවසාන වාර්තාව පිළියෙල කිරීමේ දීමනාවෙන් පහත සඳහන් ආකාරයට අඩු කර ගෙවීම් කළ හැකි වේ.

I. මාස 06කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවෙන් 05% ක්.
II. මාස 09කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවෙන් 10% ක්.
III. මාස 12කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනාවෙන් 25% ක්.

04. ඉහත 03 වගන්තියට අදාළ සියළු දීමනා හා ගාස්තු විනය පරීක්ෂණය නිම කර වාර්තාව භාර දීමෙන් අනතුරුව පමණක් ගෙවීම් කළ යුතුය.

CamScanner

05. මෙම චක්‍රලේඛය වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරනු ලැබේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එන්.වී.සෙනෙවිරත්න,
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව

එන්.වී. සෙනෙවිරත්න
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
වයඹ පළාත

පිටපත්:

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත - කා.දැ.පි.
02.ලේකම්,සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය(වයඹ) - කා.දැ.පි.
03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.පි. හා අ.ක.ස.
04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.පි හා අ.ක.ස.
05.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, කුරුණෑගල/
හලාවත/කුලියාපිටිය/මහව - දැ.පි.හා අ.ක.ස.

CamScanner